(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 9. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 ජනවාරි 08** බදාදා **පූ.භා. 9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ. එච්. එම්. එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **කේ. ඩී. ලාල් කාන්ත මහතා,** කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(මහාචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **එම්. කේ. එම්. අස්ලම් මහතා**

ගරු **හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය

ගරු බී. ආරියවංශ මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු අර්කම් ඉල්යාස් මහතා

ගරු එම්. එස්. උදුමාලෙබ්බේ මහතා

ගරු ඔෂානි උමංගා මහත්මිය

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්. ඒ. සී. එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු කෝසල නුවන් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී. කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු මොහමඩ් සාලි නලීම් මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු අමිල ප්‍රසාද් මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ. එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු ඒ. එම්. එම්. එම්. රත්වත්තේ මහත්මිය

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්‍ෂ මහතා

ගරු (ආචාර්ය) වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු ආර්. ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

**ගරු දිනිඳු සමන් මහතා**

**ගරු තිළිණ සමරකෝන් මහතා**

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා**

**ගරු අරවින්ද සෙනරත් මහතා**

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ජනාධිපතිවරයාගෙන් ලද සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ජේ/00/7/IX/3/01

2024 දෙසැම්බර් මස 26 වන දින

ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්වය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්වය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXVII කොටස; සහ

(ii) 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XX, XXI, XXII, XXIII, XXIV, XXV, XXVI හා XXVII කොටස්, සිව්වැනි කාණ්ඩයේ XIII, XIV, XV, XVI, XVII, XVIII හා XIX කොටස් සහ හයවැනි කාණ්ඩයේ XXIII, XXIV හා XXV කොටස් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද යෝජනා කරන ලදී.

(2) ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අදාළ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2023 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා අදාළ කාරක සභා වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අදාළ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2015/2016 වර්ෂය සඳහා සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අදාළ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් 2020 සහ 2022 වර්ෂ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර, එම වාර්තා අදාළ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2022 වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා අදාළ කාරක සභා වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියමය;

(ii) 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ නියෝග;

(iii) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ නියෝගය; සහ

(iv) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 සිට 14 දක්වා විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. විදේශ විනිමය පනත යටතේ නියමය:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ එවකට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජුනි 18 දිනැති අංක 2389/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(පූ.භා. 11.33ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.09ට ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ නියෝග:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 11 වගන්තිය සමඟ කියවිය යුතු 17 වගන්තිය යටතේ එවකට මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 30 දිනැති අංක 2382/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ නියෝගය:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 4 වගන්තිය යටතේ කැසිනෝ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාදීමේ නියෝග සම්බන්ධයෙන් එවකට මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 මැයි 29 දිනැති අංක 2386/09 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 54 වගන්තිය සමඟ කියවිය යුතු 71(2) වගන්තියේ (ට) ඡේදය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනතේ 2 වගන්තිය යටතේ පිහිටුවන ලද සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විමසා, කොළඹ වරාය නගරයේ සභාධිපත්‍ය දේපළ කළමනාකරණය සම්බන්ධයෙන් එවකට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 26 දිනැති අංක 2394/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. කල් තැබීම:** එකල්හි වේලාව අ.භා. 5.30 පසුකර තිබුයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, ප්‍රශ්නය නොවිමසා අ.භා. 5.36ට පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2024 ජනවාරි 09 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.